# දහනවවන හා විසිවන සියවස්වල ලක්දිව බ්‍රිතාන්‍ය සමාජය පිළිබඳ මහනුවර ගැරිසන් සුසාන භූමිය ඇසුරින් සිදු කළ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය

පී.ජේ.ඩබ්.එන්. නෝනිස්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. janeenanonis2@gmail.com

ප්‍රමුඛ පද: ගැරිසන් සුසාන භූමිය, සොහොන් කොත්, බ්‍රිතාන්‍ය පාලන සමය

## හැඳින්වීම

දහනවවන හා විසිවන සියවස් යනු, ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට යටත් වූ අවධියක් මෙන්ම මෙරට තුළ ඉංග්‍රීසි සමාජයක වර්ධනීය අවස්ථාවක් පෙන්වූ කාල පරිච්ඡේදයකි. 1796 දී මෙරටට පැමිණෙන ඉංග්‍රීසින් විසින් 1815 දී උඩරට රාජධානිය යටත් කර ගැනීමත් සමග ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජීයිය හා සංස්කෘතික අංශයන් කෙරෙහි විශාල බලපෑමක් සිදු කරන ලදි. නව පරිසරයක් තුළ ඊට අනුගත වෙමින්, විවිධ අභියෝගවලට මුහුණ දෙමින් මෙරට තම සමාජ සංස්කෘතිය ස්ථාපනය කිරීමට ඔවුන් උත්සහ ගත් ආකාරය පිළිබඳ සාධක හමුවන වැදගත් පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස මහනුවර ගැරිසන් සුසාන භූමිය හඳුන්වා දිය හැකිය. මෙම පත්‍රිකාව මගින් ගැරිසන් සුසාන භූමිය පිළිබඳ පුරාවිද්‍යාත්මක විමසීමක් සිදුකිරීමට අපේක්ෂිතය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රම භාවිතා කරන ලදි. ක්ෂේත්‍ර නොවන ගවේෂණ යටතේ පූර්ව අධ්‍යයන පිළිබඳ අවධානය යොමුකර ඇත. එහිදී මෙම ස්ථානය පිළිබඳ මින්පෙර සිදුකරන ලද පර්යේෂණ ආශ්‍රයෙන් ප්‍රකාශයට පත් වූ ග්‍රන්ථ හා ලිපි ආදිය අධ්‍යයනය කෙරිණි. මීට අමතරව මෙම ස්ථානයට අදාළව සිතියම්, සැලසුම් හා ඡායාරූප පිළිබඳ අවධානය යොමු කළ අතරම ජනප්‍රවාද මගින් ද තොරතුරු ලබා ගැනීම සිදු විය.

ක්ෂේත්‍ර ගවේෂණ යටතේ ගැරිසන් සුසාන භූමියේ භාරකරු හා සංරක්ෂණ නිලධාරීන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, සොහොන් කොත් නිරීක්ෂණය කිරීම ආදී ක්‍රමවේද ඔස්සේ තොරතුරු ලබා ගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡා

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව, මහනුවර ජාතික කෞතුකාගාරයට යාබදව, උඩවත්ත වනයට මායිම් වන ලෙස මෙම සොහොන් බිම පිහිටා ඇත. පර්චස් 120ක බිම් තීරුවකින් සමන්විත මෙහි සොහොන් කොත් 195ක් දැකගත හැකිවන අතර ඒ සියල්ලම බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් වේ. ගැරිසන් සුසාන භූමිය 1817 සිට 1909 දක්වා භාවිතාකර ඇති අතර 1865 දී මහයියාව සුසාන භූමිය ආරම්භ කිරීමත් පසු මෙහි භාවිතය අවම විය. ආරම්භයේ දී මෙහි කටයුතු සෙම්ෂෝ නම් දේවස්ථානයක් මගින් පාලනය වූ අතර ඉන් පසුව එය මහනුවර ශාන්ත පාවුළු දේවස්ථානය මගින් පාලනය විය. වර්තමානයේ සුසානය භාරව ඇත්තේ

බ්‍රිතාන්‍යය යුධ සොහොන් සංවිධානයට වේ.

නිර්මිත හැඩ අනුව සොහොන් ස්ථම්භ, මේසාකාර සොහොන්, සොහොන් පුවරු ලෙස මෙහි ඇති සොහොන් වර්ග කළ හැකිය. එමෙන්ම කිරිගරුඬ, කළුගල් හා ගඩොල් යොදා ගනිමින් සොහොන් කොත් නිමවා ඇති අතර කැටයම් සහිත පුවරු එංගලන්තයේ සිට ආනයනය කර ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2011.07.22 වන දින මෙම සුසාන භූමිය ආරක්ෂිත ස්මාරකයක් ලෙස නම් කර තිබේ. ගැරිසන් සුසාන භූමිය විධිමත්ව අධ්‍යයනය කිරීමේ දී දහනවවන හා විසිවන සියවස්වල සිංහල සමාජය තුළ ඉංග්‍රීසින්ගේ භූමිකාව පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය.

ගැරිසන් සුසාන භූමිය අධ්‍යයනයෙන් ලබා ගත් තොරතුරු අනුව එහි මිහිදන්කර ඇති පුද්ගලයන්ගෙන් 60% ක් පිරිමි හා 40% ක් කාන්තාවන් ලෙස හඳුනාගත හැකි වේ. මේ මගින් බ්‍රිතාන්‍යය පාලන සමයේ ලංකාවේ විවිධ අංශවල විවිධ සේවාවන් සඳහා ඉංග්‍රීසි කාන්තාවන්ට වඩා පුරුෂයන්ගේ දායකත්වය ඉහළ අගයක් ගත් බවට නිගමනය කළ හැකිය.

වයස් සීමා අධ්‍යයනය කිරීමේ දී මිහිදන් කොට ඇති අයගෙන් වැඩි පිරිසක් වයස අවුරුදු 40ට අඩු පුද්ගලයින් වන අතර එයින් 40% ක් පමණ ප්‍රමාණයක් කුඩා ළමුන් ලෙස හඳුනා ගත හැකිය. දහනවවන සියවසට පෙර ලංකාවේ සේවය සඳහා පැමිණියේ බ්‍රිතාන්‍යය නිලධාරීන් පමණක් වුව ද 1815 දී උඩරට රාජධානිය යටත් කර ගැනීමත් සමග මෙරට තම පාලනය හා ආරක්ෂාව තහවුරු වීමෙන් පසුව ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ද ලංකාවට ගෙන්වා ගත් අතර එමගින් මෙරට ඉංග්‍රීසි සමාජයේ වර්ධනීය අවධියක් උදා වූ බවට නිගමනය කළ හැකිය.

මෙම සුසාන භූමිය තුළ විවිධ වෘත්තීන්ට අයත් පුද්ගලයන් මිහිදන් කොට ඇති අතර වැවිලිකරුවන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, නීතිඥයන්, භාෂා පරිවර්තකයන්, හමුදා නිලධාරීන්, රාජ්‍යය පරිපාලන නිලධාරීන් මෙන්ම ඉහළ නිලධාරීන්ගේ භාර්යාවන් ද හඳුනා ගත හැකි වේ. මේ අනුව නිගමනය කළ හැක්කේ දහනවවන හා විසිවන සියවස්වල ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජීයය හා සංස්කෘතික අංශයන් තුළ බ්‍රිතාන්‍යය බලපෑම පූර්ණව පැවති බවයි.

ගැරිසන් සොහොන් බිමේ මිහිදන් කෙරූ පුද්ගලයන් විවිධ හේතු මත මියගොස් ඇති බව, සොහොන් කොත් හා ලිඛිත මූලාශ්‍ර මගින් අනාවරණය වන අතර මැලේරියාව, කොළරාව වැනි වසංගත ඇතුලු ලෙඩරෝග, වන සතුන්ගේ පහරදීම්, දේශගුණය නොගැලපීම්, හදිසි අනතුරු මෙන්ම තවත් විවිධ හේතුන් ඒ අතර වේ. මේ මගින් දහනවවන හා විසිවන සියවස් තුළ බ්‍රිතාන්‍යය සමාජය ලක්දිව ව්‍යාප්ත වීමේ දී විවිධ අභියෝග රැසකට මුහුණ පෑමට සිදු වී ඇති බව නිගමනය කළ හැකිය.

වැඩි පිරිසකගේ අවධානයට ලක් නොවෙමින් මහනුවර නගරය තුළ සැඟවී තිබෙන ගැරිසන් සුසාන භූමිය, ඓතිහාසික සාහිත්‍යය මූලාශ්‍ර පුරාවිද්‍යාත්මකව සනාථ කරමින් ලංකාවේ ඉතිහාසය ගොඩ නැගීමට දායක වන අතර දහනවවන හා විසිවන සියවස්වල මෙරට තුළ බ්‍රිතාන්‍යයන්ගේ දේශපාලන, ආර්ථික, සමාජීයය හා සංස්කෘතික භූමිකාව පිළිබඳව මෙන්ම අධිරාජ්‍යවාදීන්ගේ අවැසිතා සපුරාලීමට මෙරටට පැමිණි ඉංග්‍රීසි ජාතිකයන්ගේ දුෂ්කර ජීවිතය පිළිබඳව ද තොරතුරු රැසක් අනාවරණය කරන සුවිශේෂී පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස හඳුන්වා දිය හැකිය.